**ශීර්ෂය 196 - විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය**

**-----------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

**-------------------------------**

විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුලත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ප්‍රධාන ගණන් දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වන වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---------------------------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**-----------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මුලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි

ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.
වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වු ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සඳහා අනුරූප වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධාවලට අනුකූල නොවීම**

2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්, එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථා පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය තුළ සටහන 6 යටතේ දක්වා ඇති අනෙකුත් භාණ්ඩ හා සේවා සඳහා මුළු ශුද්ධ ප්‍රතිපාදනය භාණ්ඩාගාර පොත් අනුව රු.610,970,200 ක් වන අතර එය ගිණුම් අනුව රු.598,167,200 වශයෙන් පෙන්වා තිබුණි. මෙහි වෙනස වූ රු.12,803,000 ක මුදල, ගිණුමට අනුව සටහන් අංක 9 යටතේ වෙනත් පුනරාවර්තන වියදම් යටතේ පෙන්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල විය යුතු වීම. | ඉදිරියේදී මෙවැනි තත්වයන් ඇති නොවීමට සටහන් කර ගතිමි. |

| | | |
|---|---|---|
| (ආ) මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය තුළ සටහන් අංක 12 යටතේ දක්වා ඇති ප්‍රාග්ධන මාරු කිරීම්වල තත්‍ය අගය භාණ්ඩාගාර පොත් අනුව රු.1,057,920,174 ක් වන අතර එය ගිණුම් අනුව රු.1,096,522,319 වශයෙන් පෙන්වා තිබුණි. මෙහි රු.38,602,145 ක වෙනසට හේතු පැහැදිලි නොකෙරුණි. | - එම - | - එම - |
| (ඇ) මූල්‍ය කාර්යසාධන ප්‍රකාශ තුළ සටහන් අංක 15 යටතේ දක්වා ඇති වෙනත් මූලධන වියදම් සඳහා වූ තත්‍ය අගය භාණ්ඩාගාර පොත් අනුව රු.405,832,120 ක් වූ අතර එය ගිණුම් අනුව රු.367,229,974 වශයෙන් පෙන්වා තිබුණි. ඒ අනුව වෙනස වූ රු.38,602,145 ක් සඳහා හේතු පැහැදිලි නොවුණි. | - එම - | - එම - |
| (ඇ) 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ සටහන් අංක 9 යටතේ සිංහල පිටපත තුළ ශුද්ධ ප්‍රතිපාදනය ලෙස රු.12,803,000 ක් පෙන්වා තිබූ අතර ඉංග්‍රීසි පිටපත තුළ එම අගය පෙන්වා නොතිබූ බැවින් සිංහල පිටපත හා ඉංග්‍රීසි පිටපත අතර වෙනස්කම් ඇති බව නිරීක්ෂණය විය. | - එම - | - එම - |

## 1.6.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ස්ථාවර වත්කම් වූ මෝටර් රථ 45 ක තක්සේරු අගය වූ රු.394,005,500 ක | මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූල විය යුතු බව | ඉදිරියේදී අදාල ආකෘතියට ඇතුලත් කරන බව දන්වා ඇත. |

| | | |
|---|---|---|
| වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ඇතුලත් කර නොතිබූ අතර ACA 6 ආකෘතිය වූ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයටද ඇතුලත් කර නොතිබුණි. | | |
| (ආ) වර්ෂය තුළ මිලදීගත් කාර්යාල උපකරණ හා ලී බඩුවල අගය වූ රු.11,551,316 ක මුදල මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දේපල, පිරියත හා උපකරණ යටතේ දක්වා නොතිබුණි. | - එම - | - එම - |
| (ඇ) අමාත්‍යාංශය යටතේ පවතින විද්‍යා මධ්‍යස්ථාන 267 ක් සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහාද මිලදී ගැනීම් සිදුකරන අතර වර්ෂය තුළ මිලදී ගත් රු.33,001,339 ක දේපල, පිරියත හා උපකරණ හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබූ අතර පෙර වර්ෂවලට අයත් දේපල, පිරියත හා උපකරණද හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | - එම - | - එම - |

### 1.6.3 අත්තිකාරම් ගිණුම් ශේෂ

අත්තිකාරම් ගිණුම්වල වර්ෂය අවසානයට වූ ශේෂ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ඉදිරිපත් කල සැසඳුම් ප්‍රකාශය ආයතන සංග්‍රහයේ XXIV අනුව එදිනට අයවීම් හිඟ හිට | ඉදිරි කටයුතු සිදු කරමින් වන පරිච්ඡේදයේ 4 වන පවතී. | |

| | | |
|---|---|---|
| තිබුණු ශේෂවල එකතුව රු. 336,799 ක් වූ අතර එම හිඟ හිටි ණය ශේෂ වර්ෂ 1 ක සිට වර්ෂ 2 ක් දක්වා කාල පරාසය සිට පැවත එමින් තිබුණත්, එම හිඟ හිටි ණය ශේෂ අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි. | ඡේදයේ සඳහන් විධි විධාන අනුගමනය කළ යුතු වීම | |
| (ආ) 2016 ජූනි 15 දින සේවයේ යෙදී සිටියදී මියගිය පුද්ගලයෙකුගෙන් අයවිය යුතු රු. 98,154 ක ණය ශේෂය අයකර ගැනීමට 2019 අප්‍රේල් 30 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | - එම - | - එම - |

## 1.6.4 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) **ස්ථාවර වත්කම් ලේඛනය** | | |
| 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 502(2) ප්‍රකාර එහි 11 වැනි පරිශිෂ්ටයෙහි සඳහන් පරිදි ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලින කර නොතිබුණි. | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 502(2) ප්‍රකාර එහි 11 වැනි පරිශිෂ්ටයෙහි පරිදි ස්ථාවර වත්කම් ලේඛනය අදාළ වන පරිදි විගණකාධිපතිගේ එකඟත්වය ඇතිව පවත්වා ගත යුතු වීම | අදහස් දක්වා නැත. |

(ආ) **පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය**

| | | |
|---|---|---|
| 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනයක් යාවත්කාලින කර නොතිබුණි. | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගත යුතු වීම | අදහස් දක්වා නැත. |

(ඇ) **ඇප ලේඛනය**

| | | |
|---|---|---|
| මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරින් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 891(1) සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතු වීම | අදහස් දක්වා නැත. |

(ඈ) **බැරකම් පිළිබඳ ලේඛනය**

| | | |
|---|---|---|
| මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් පිළිබඳ ලේඛනය යාවත්කාලින කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් නිතිපතා පරික්ෂා කළ හැකි වන පරදි බැරකම් ලේඛනයක සටහන් කළ යුතු වීම | අදහස් දක්වා නැත. |

### 1.6.5 විගණන සාක්ෂි නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 8 කට සහ ඉකුත් වර්ෂවලදී නිකුත් කළ විගණන විමසුම් 1 කට අදාළව 2019 මැයි 31 දින වන විටත් පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 155 ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් මුදල් රෙගුලාසි 452(1) හි සඳහන් විගණන විමසුම් ලේඛනය නියමිත කාලයකට පසුව පරීක්ෂා කර බලා ලැබී ඇති විගණන විමසුම්වලින් පෙන්වා දී ඇති අඩුපාඩු | අදහස් දක්වා නැත. |

| | | |
|---|---|---|
| | | නිවැරදි කිරීමට කටයුතු කළ යුතු අතර, එම විමසුම්වලට පිළිතුරු ලබා දිය යුතුය. එසේ පිළිතුරු ලබාදි ම ප්‍රමාද විය හැකි විමසුම් වේනම් ඒ සඳහා අතුරු වාර්තාවක් යැවීමට කටයුතු කළ යුතු වීම |

**1.6.6 අධිකාර බලය නොමැති වූ ගනුදෙනු**

**---------------------------------------**

අමාත්‍යාංශය විසින් අධිකාරී බලය නොමැතිව පහත සඳහන් ගනුදෙනුව කර තිබුණි.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ හිටපු රාජ්‍ය අමාත්‍යවරයා භාරයේ ඇති WPPH – 0153 සහ WPPH – 4650 යන වාහන 02 ක නැවත අමාත්‍යාංශය වෙත භාරදීමට කටයුතු කර නොතිබුණි. | මෙම වාහන විධිමත් පරිදි භාර දීමට කටයුතු කළ යුතු වීම | ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. |

**2. මූල්‍ය සමාලෝචනය**

**---------------------**

**2.1 අග්‍රිම කළමනාකරණය**

**-------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ජාතික විද්‍යා මධ්‍යස්ථානය ස්ථාපිත කිරීමට නාගරික සංවර්ධන අධිකාරියෙන් වෙන්කරගත් ඉඩම වෙනුවෙන් ගෙවීම් කිරීමට භාණ්ඩාගාරයෙන් අරමුදල් නොලැබීම නිසා යෝජිත කටයුතු ආරම්භ කිරීම ප්‍රමාද වී තිබුණි. | ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කල යුතු වීම හා අරමුදල් ලබා ගැනීම කඩිනමින් සිදු කළ යුතු වීම. | ජාතික විද්‍යා මධ්‍යස්ථානය ස්ථාපිත කිරීමේ කටයුතු තවදුරටත් ක්‍රියාත්මක වන අතර 2018 වර්ෂයට අදාල ගෙවීම් මේ වන විට අවසන් කර ඇති බව දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කාර්මික තාක්‍ෂණ ආයතනයට පෙට්‍රෝලියම් නිෂ්පාදන පරීක්‍ෂාව සඳහා පහසුකම් සැලසීමට රු. මිලියන 100 ක් වෙන් කර තිබුන ද උපයෝජනය කර තිබුණේ රු.මිලියන 05 කි. භාණ්ඩාගාරය විසින් අක්මුදල් නිකුත් නොකිරීම නිසා මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට නොහැකි වී තිබුණි. | ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කළ යුතු වීම. | අදහස් දක්වා නැත. |

## 2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 50 (II) ප්‍රකාරව ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන් නිවැරදිව පිළියෙල කිරීම ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාගේ වගකීම වුවත් ඒ අනුව කටයුතු කර නොතිබූ නිසා වැය විෂයයන් 11 ක් සඳහා රු. 625,700,000 මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම | විශේෂ ව්‍යාපෘති අමාත්‍යාංශයේ වත්කම් මෙම අමාත්‍යාංශයට පවරා ගැනීමත් සමඟ ඇති වූ වත්කම් අතිරික්ත වීමත්, ප්‍රසම්පාදන කමිටු සාමාජිකයන් වෙනස් වීමත් නිසා ප්‍රසම්පාදන කටයුතු සීමා වීම හා අමාත්‍යාංශ සංශෝධනයට ලක් වීම නිසා ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. |
| (ආ) | වැය විෂයයන් 20 ක් සඳහා වෙන්කර තිබූ ප්‍රතිපාදනයෙන් සියයට 50 කට වඩා වැඩි ප්‍රමාණයක් ඉතිරි වී තිබුණි. | - එම - | වැය විෂයයන් බොහොමයක් සඳහා වියදම් දැරීමට භාණ්ඩාගාරයෙන් අක්මුදල් නොලැබීම නිසා රු.256,121,352 ක් වූ වවුචර් ගෙවීම් කල නොහැකිව 2018 දෙසැම්බර් 31 දිනට අක්මුදල් පියවීමේදී ඉතිරිව තිබුණි. |

## 2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ බැරකම් පිළිබඳ ප්‍රකාශයේ - සටහන් iv යටතේ වියදම් ඇතුලත් කර නොතිබුණි. | මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ බැරකම් පිළිබඳ ප්‍රකාශය- සටහන් iv යටතේ වියදම් ඇතුලත් කළ යුතු වීම | ඉදිරියේදී එම බැරකම් සටහන (iv) යටතේ පෙන්වීමට සටහන් කර ගතිමි. |
| (ආ) | මු.රෙ. 94 (1) ප්‍රකාරව වෙනත් ආකාරයකට විධිවිධාන සලස්වා ඇති අවස්ථාවලදී හැර වාර්ෂික ඇස්තමේන්තුවල ඒ සඳහා මුදල් ප්‍රතිපාදන ඇත්නම් මිස කිසිම දෙපාර්තුමේන්තුවක් හෝ අමාත්‍යාංශයක් විසින් වැඩක් හෝ සේවයක් සැලසුමක් සඳහා කිසිම වියදමකට හෝ බැඳීමකට හෝ නොබැඳිය සිටිය යුතු අතර ඒ වෙනුවෙන් දරන බැරකම් සහ වැය ප්‍රමාණය කිසිම විටක මුදල් වර්ෂය සඳහා ප්‍රතිපාදන මුදල් නොඉක්මවිය යුතුය. (සැපයීම් සහ සේවා සම්බන්ධයෙන් නොවන විට) එසේ වුවත් වැය විෂයයන් 04 කට අදාල රු.234,983 කින් ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට බැඳී තිබුණි. | මුදල් රෙගුලාසි 94 (1) ප්‍රකාරව දිගින් දිගටම බැරකම් වලට එළඹීම සිදු නොකළ යුතු බැවින් ඒ අනුව කටයුතු කළ යුතු බව | මෙවැනි ප්‍රතිපාදන ඉක්මවීම ඉදිරියේදී හැකිතාක් අවම කිරීමට සටහන් කර ගන්නා ලදී. |

## 2.4 තැන්පත් ශේෂයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වර්ෂ 02 ක් ඉක්මවූ එකතුව රු. 1,995,988 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කල යුතු වීම | මෙය STS Forum සඳහා ලද මුදලක් වන අතර මෙම මුදල ගෙවීමේ කටයුතු සඳහා අවශ්‍ය කමිටු තීරණ ගනිමින් පවතී. ඒ අනුව කඩිනමින් මෙම මුදල ගෙවා අවසන් කිරිමට කටයුතු කරන බව කාරුණිකව සඳහන් කරමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 දැක්ම හා මෙහෙවර

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| විදාතා මධ්‍යස්ථාන 267 ක් හරහා ගමට තාක්ෂණය, මහජනතාව සහ පාසැල් සිසුන් අතර විද්‍යාව ප්‍රචලිත කිරිම විදාතා මධ්‍යස්ථාන වල අරමුණ වුවත් සෑම මධ්‍යස්ථානයකම සාම්ප්‍රදායික පුහුණු වැඩසටහන් හා දැනුවත් කිරීම් වැඩසටහන් පමණක් පවත්වා තිබුණි. | සාම්ප්‍රදායික ක්‍රමවලින් බැහැරව නවීන තාක්‍ෂණික ක්‍රම භාවිතයන් පිළිබඳ පුහුණු වැඩසටහන් සෑම විදාතා මධ්‍යස්ථානයකම පැවැත්විය යුතු වීම | විදාතා සම්පත් මධ්‍යස්ථාන වලින් ප්‍රදේශයේ ජනතාවගේ ඉල්ලීම පරිදි පුහුණු වැඩසටහන් හා දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම ද සිදු කරන බැවින් පළමුව එම ඉල්ලීම් සඳහා කටයුතු කර ඇත. එසේම නව තාක්ෂණික පුහුණු ලෙස සේදුම් කාරක නිශ්පාදන, පරිගණක දෘඩකාංග එකලස් කිරීම හා දෝෂ නිරාකරණය රසායනික ද්‍රව්‍ය ආශ්‍රිත නිශ්පාදන, ශාකසාර ආශ්‍රිත නිශ්පාදන, නැනෝ තාක්ෂණයේ භාවිතයන් වැනි පුහුණු වැඩසටහන් ද පවත්වා ඇත. |

## 3.2 සැලැසුම් කිරීම

2014 පෙබරවාරි 17 දිනැති අංක 2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කාර්යසාධනය සම්බන්ධ සැලසුම් කිරීම පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) සමාලෝචිත වර්ෂයට අදාල වාර්ෂික අයවැය පදනම් කරගත් ප්‍රමුඛතා අනුව සකස් කල ක්‍රියාකාරකම් සැලසුම් (Activity plan) ක්‍රියාත්මක කාල රාමුව (Time line) හා එම ක්‍රියාකාරකම් වල අපේක්ෂිත නිමවුම් ප්‍රතිඵල (Out put) ඇස්තමේන්තු කර සඳහන් කර නොතිබුණි. | 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකාරකම් සැලසුම්, ක්‍රියාත්මක කලයුතු කාල රාමුව, එම ක්‍රියාකාරකම්වල අපේක්ෂික නිමැවුම් හා ප්‍රතිඵල ඇස්තමේන්තු කර සඳහන් කල යුතුව ඇත. | පිළිතුරු දක්වා නොතිබුණි |
| (ආ) සමාලෝචිත වර්ෂයේ යාවත්කාලීන කල ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සේවයේ යෙදී සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර හා අභ්‍යන්තර විගණන සැලැස්ම ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර නොතිබුණි. | 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය හා තත්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර ඉදිරිපත් කල යුතු වීම. | පිළිතුරු දක්වා නොතිබුණි |

## 3.3 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) සෝලා පැනල් ව්‍යාපෘතියේ කලාප වශයෙන් තෝරාගත් ගුරුවරුන් 100 ක් සඳහා | සැලසුම් කළ කාර්යභාරය ඉටු කිරීමට අවශ්‍ය වන අනෙකුත් සැලසුම් හා කාල රාමුව නිවැරදිව සැලසුම් | සොලා පැනල් ව්‍යාපෘතියේ කලාප වශයෙන් ගුරුවරු 100 ක් සඳහා වැඩසටහන් පැවැත්වීම සඳහා අවශ්‍ය |

| | | | |
|---|---|---|---|
| | පුහුණු වැඩසටහන් පැවැත්වීමට ඉලක්ක කර තිබුණ ද වර්ෂය අවසාන වන විට ඉන් කිසිදු වැඩසටහනක් පවත්වා නොතිබුණි. | කල යුතු වීම | ගුරුවරුන්ගේ නාම ලේඛනය මේ වන තුරු අධ්‍යාපන අමාත්‍යංශය මඟින් ලබා නොදීම නිසා වැඩසටහන පැවැත්වීමට නොහැකි වීම. |
| (ආ) | සෝලා පැනල් ව්‍යාපෘතිය සඳහා කාර්මික විද්‍යාල වල සිසුන් 250 ක් ලියාපදිංචි කර වැඩසටහන පැවැත්වීමට සැලසුම් කර තිබුණද එම කිසිදු වැඩසටහනක්ද මෙතෙක් පවත්වා නොතිබුණි. | සැලසුම් කළ කාර්යභාරය ඉටු කිරීමට අවශ්‍ය වන අනෙකුත් කටයුතු හා කාල රාමුව නිවැරදිව සැලසුම් කල යුතු වීම | මෙම වැඩසටහන 2019 වර්ෂයේ අවසන් වීමට පෙර සාර්ථකව සිදු කිරීමට යෝජිතය. |
| (ඇ) | ජාතික විද්‍යා මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට 2018 වර්ෂයේ අවසන් කාර්තුවේදී සැලසුම් කර තිබුණ ද එහි මූලික කටයුතු වූ සැලසුම් සැකසීම හා ඉඩම මිලදී ගැනීමේ කටයුතු ද අවසන් කර නොතිබුණි. | වාර්ෂික අය වැය මඟින් ප්‍රතිපාදනය කරන මුදල් කාර්යක්ෂමව ප්‍රයෝජනයට ගත යුතු වීම | අදහස් දක්වා නැත. |
| (ඇ) | ජාන විද්‍යාව පිළිබඳ විශිෂ්ඨත්වයෙන් යුත් මධ්‍යස්ථානයක් පිහිටුවීමට ප්‍රවර්ථන වර්ෂයේදීද මුදල් වෙන්කර තිබුණි. එහෙත් ඉන් කිසිදු මුදලක් උපයෝජනය කර නොතිබුණි. | පෙර වර්ෂයේදී ඇස්තමේන්තු වෙන්කර තිබූ ව්‍යාපෘතියක් වන අතර සමාලෝචිත වසරේ ද රු.මිලියන 50ක් වෙන්කර තිබූ අතර ඇස්තමේන්තු සකස් කිරීමේදී අවදානයෙන් කටයුතු කල යුතු වීම | සෞඛ්‍ය අමාත්‍යංශය සමඟ ඒකාබද්ධව අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කිරීමට තිබූ නමුත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිචාරයක් නොලැබීම. |

## 3.4 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරික්ෂණය | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයට විද්‍යාගාරයක් ඉදිකිරීම සඳහා රු.මිලියන 44 ක් වෙන්කර තිබුණ ද වර්ෂය අවසානය වනවිට මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. ප්‍රසම්පාදන කටයුතු සඳහා දීර්ඝ කාලයක් ගත වීම ඊට හේතු ලෙස දක්වා තිබුණද, මෙම ව්‍යාපෘතිය අයවැය යෝජනා වලින් යෝජිත එකක් වූ බැවින් සැලැස්මකට අනුව කටයුතු නොකිරීම මෙම ප්‍රමාදයට ප්‍රධාන හේතුව බව විගණනයේදී නිරීක්ෂණය විය. | අයවැය යෝජනාවක් වූ මෙම ව්‍යාපෘතියේ ශක්‍යතාවය හා සංකීර්ණත්වය හඳුනාගෙන ඒ අනුව සැලසුම් සකස් කල යුතු වීම | අදහස් දක්වා නැත. |
| (ආ) | කාර්මික තාක්ෂණ ආයතනය මඟින් පෙට්‍රෝලියම් නිෂ්පාදන පරීක්ෂාව සඳහා පහසුකම් සැලසීමේ ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 100 ක් වෙන්කර තිබුණද වර්ෂය අවසාන වන විට රු.මිලියන 5 ක් පමණක් උපයෝජනය කර තිබුණි. සමස්ත ප්‍රතිපාදනයෙන් සියයට 95 ක ප්‍රතිශතයක් උපයෝජනය නොකර තිබූ අතර භාණ්ඩාගාරයෙන් අරමුදල් නිකුත් නොකිරීම නිසා ව්‍යාපෘතිය ආරම්භ කිරීමට නොහැකි වී තිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කළ යුතු වීම | අදහස් දක්වා නැත. |
| (ඇ) | යන්ත්‍ර ඉලෙක්ට්‍රෝන විද්‍යාවෙන් සවිබල ගැන්වෙන ආර්ථික සංවර්ධන මූලාරම්භය (MEDI) | සැලසුම් කළ කාර්යභාරය ඉටු කිරීමට අවශ්‍ය වන අනෙකුත් සැලසුම් හා කාල | අදහස් දක්වා නැත. |

| | | | |
|---|---|---|---|
| | හරහා නිෂ්පාදන සැලසුම් ඉංජිනේරු විද්‍යාව (PDE) සඳහා සහය ලබා දීම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වේ. එමෙන්ම දේශීය හා ගෝලීය වශයෙන් බලපත්‍රලාභී නිෂ්පාදකයින් සඳහා සුහුරු යන්ත්‍ර සැලසුම් නිර්මාණය හරහා ආර්ථිකය සහ අධිතාක්ෂණික අපනයනයන් වර්ධනය කරවීමත් ආනයනයන් පහත හෙලීමත් මෙම ව්‍යාපෘතියෙන් බලාපොරොත්තු වේ.<br>මේ සඳහා රු.මිලියන 325 ක වියදම් ඇස්තමේන්තුවක් පැවතුණු අතර රු.මිලියන 250 ක් පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කිරීමෙන් සමාලෝචිත වර්ෂයටද ප්‍රතිපාදන වෙන් කරගෙන තිබුණි. නියමිත සැලසුමකට අනුව කටයුතු නොකිරීම හා සැලසුම් වල තිබූ දුර්වලතාවය නිසා ඉහත මුලු ප්‍රතිපාදනයන්ම ඉතිරි වී තිබුණි. | රාමුව නිවැරදිව සැකසිය කළ යුතු වීම | |
| (ඇ) | ප්‍රවර්ථන වර්ෂයේදී ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් ව්‍යාපාර සම්පත් සැලසුම් කිරීමේ (Enterprises Resource Planning) පද්ධතිය සඳහා රු.මිලියන 150 ක් වෙන්කර තිබුණද 2018 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශයේ වෙන් කරන ලද මුළු මුදල් ප්‍රමාණයම ඉතිරි වී තිබුණි. මෙයට හේතු ලෙස කළමනාකරණ මණ්ඩලය විසින් මෙම ව්‍යාපෘතිය නතර කිරීමට තීරණයක් ගෙන ඇති බව දක්වා තිබුණි. එහෙත් අවශ්‍යතා හඳුනාගෙන සැලැස්මකට අනුව කටයුතු නොකිරීම නිසා මෙම | අයවැය යෝජනාවක් වූ මෙම ව්‍යාපෘතියේ ශක්‍යතාවය හා සංකීර්ණත්වය හඳුනාගෙන ඒ අනුව සැලසුම් සකස් කල යුතු වීම. | ප්‍රසම්පාදන ක්‍රියාවලියේ තාක්ෂණ ඇගයීම් සංකීර්ණ වීම සහ අවස්ථා කීපයකදී අදාල ක්‍රමවේදයන් සලකා බැලීමට සිදු වීම සහ සක්‍යතාවය පිළිබඳ ගැටළු හේතුවෙන් ව්‍යාපෘතිය තාවකාලිකව නවතා දැමීමට සිදු වීම. |

ව්‍යාපෘතිය ආරම්භ කිරීමට නොහැකි වී තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

**3. 5 වත්කම් කළමනාකරණය**

**----------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ------------- | ---------------------------------- |
| (අ) | මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ අවසාන දිනය වූ 2018 පෙබරවාරි 28 දිනට භාණ්ඩ සත්‍යාපනය (Verification) කර නොතිබුණි. | අවසාන මූල්‍ය ප්‍රකාශන දිනය වූ 2018 පෙබරවාරි 28 දිනට භාණ්ඩ සත්‍යාපනය (Verification) කළ යුතු වීම | අදහස් දක්වා නැත. |
| (ආ) | විද්‍යා,තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ හිටපු රාජ්‍ය අමාත්‍යවරයාට නිකුත් කරන ලද ඉන්වෙන්ට්‍රි අයිතම් හා ස්ථාවර වත්කම් වන ලැප්ටොප් පරිගණක 01 ක්, වොෂින් මැෂින් 01 ක් හා ජංගම දුරකථනයන් ඇතුළු අයිතම් 18 ක් විගණන දිනය වූ 2019 පෙබරවාරි 14 දින වන විටත් ආපසු ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අමාත්‍යාංශයේ අරමුණු හා පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා ලබා දී ඇති වත්කම් වෙනත් පාර්ශවයන්ට අමාත්‍යාංශයේ අරමුණු ඉටු කරගැනීමට බාධාවක් නොවන ලෙස හා එම වත්කම් විධිමත්ව නැවත භාර ගැනීමට කටයුතු කල යුතු වීම | අදහස් දක්වා නැත. |
| (ඇ) | WPKY-8402 හා WPKN-1910 අංක දරණ වාහන 2 වෙනත් අමාත්‍යාංශ 2 කට විධිමත් අනුමැතියකින් තොරව මුදාහැර තිබුණි. | අමාත්‍යාංශයේ අරමුණු හා පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා ලබා දී ඇති වත්කම් වෙනත් ආයතනවලට පැවරීමේ දී අමාත්‍යාංශයේ අරමුණු ඉටුකර ගැනීමට බදාවක් නොවන පරිදි හා එම වත්කම් විධිමත්ව පවරා දීමට කටයුතු කළ යුතු වීම | WPKY 8402 රථයේ අයිතිය දැනට භාවිතා කරනු ලබන සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය වෙත පවරා දීම සඳහා කොම්ප්ට්රෝලර් ජනරාල් වෙතින් අනුමැතිය ලබා ගැනීම සඳහා 2019 මැයි 07 දිනැති ලිපියක් යවා ඇත.<br><br>WPKU - 1910 රථය දැනට |

| | | | |
|---|---|---|---|
| | | | භාවිතා කරන්නේ නිවාස ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය වන අතර එය භාර දෙන ලෙස දැනුම් දී ඇත. |
| (ඇ) | මැද දුම්බර විදාතා මධ්‍යස්ථානයේ විද්‍යා හා තාක්‍ෂණ නිලධාරී 2016 දෙසැම්බර් 09 දින සිට සේවයට වාර්තා කර නොතිබුණි. ඔහු වෙත නිකුත් කර තිබූ ලියාපදිංචි අංක WP-MQ-2613 දරණ යතුරුපැදියේ වටිනාකම රු. 144,920 ක් වූයෙන් එකී මුදල නැවත අයකර ගැනීමට හෝ යතුරුපැදිය නැවත අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ආයතන සංග්‍රහයේ **XXIV** වන පර්ච්ඡේදයේ 4 වන වගන්තිය අනුව කටයුතු කළ යුතු වීම | මැදදුම්බර විදාතා මධ්‍යස්ථානයේ කේ.ඒ.ආර්. ධර්මකීර්ති මහතා තනතුර අතහැර යාමේ නිවේදනය නිකුත් කර මාස 03කට පෙර අභියාචනයක් ලබා දීම හේතුවෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස් පරිදි නැවත සේවයේ පිහිටුවීමට හෝ විශ්‍රාම ගැන්වීම සම්බන්ධ කටයුතු සිදුකරමින් පවතී. විනය බලධරයා විසින් නැවත සේවයේ පිහිටුවීම හෝ විශ්‍රාම ගැන්වීම ප්‍රතික්ෂේප කළහොත් යතුරුපැදියේ වටිනාකම අයකරගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. |
| (ඉ) | පාතදුම්බර විදාතා මධ්‍යස්ථානයේ විද්‍යා හා තාක්‍ෂණ නිලධාරී මහතා 2016 නොවැම්බර් 15 දින සිට සේවයට වාර්තා කර නොතිබූ අතර ඒ මහතා වෙත නිකුත් කර තිබූ යතුරුපැදියේ ලියාපදිංචි අංකය පිළිබඳ තොරතුරු අමාත්‍යාංශය සතුව නොතිබුණි. ඒ මහතා වෙත ලබා දී තිබූ යතුරුපැදියේ වටිනාකම රු. 144,920 ක් | ආයතන සංග්‍රහයේ **XXIV** වන පර්ච්ඡේදයේ 4 වන වගන්තිය අනුව කටයුතු කළ යුතු වීම | පාතදුම්බර විදාතා මධ්‍යස්ථානයේ විද්‍යා හා තාක්ෂණ නිලධාරි බී.ඒ.ජී. අම්බලන්තැන්න මහතාට යතුරුපැදියේ වෙළඳපොළ වටිනාකම ගෙවන ලෙස 2017.07.21, 2017.08.11, 2017.10.24 හා 2018.08.10 දිනැති ලිපි මගින් දන්වා ඇති නමුත් මෙතෙක් එම මුදල් ගෙවීමට නිලධාරියා කටයුතු කර නොමැති බැවින් මේ වන |

| | | |
|---|---|---|
| වූයෙන් එකී මුදල නැවත අයකරගැනීමට හෝ යතුරුපැදිය නැවත අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | | විට නීතිපති උපදෙස් සඳහා යොමුකර ඇත. |

## 3.6 රජයේ නිලධාරීන් ඇප තැබීම

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ------------- | --------------------------------- |
| මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව රජයේ මුදල් ආදායම මුද්දර හෝ බඩු භාරව සිටීම එසේ නැතහොත් බඩු බාහිරාදිය නිකුත් කිරීම සම්බන්ධයෙන් පරිපාලනමය වශයෙන් වගකිව යුතු හෝ බලය පැවරීම යටතේ එම කටයුතු පවරනු ලැබූ ඇති නිලධාරීන් ද රජයේ ගිවිසුම්වලට අදාල වවුචර් සහතික කරන, චෙක්පත් අත්සන් කරන අයද ඇප ආඥා පනතේ 612 වන අධිකාරිය අනුව ඇප තැන්පතු තැබිය යුතු වුවත් එකී කටයුතු වලට සම්බන්ධ අමාත්‍යාංශයේ නිලධාරීන් ඇප තැන්පතු තබා නොතිබුණි. | මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව කටයුතු කල යුතු වීම | අදහස් දක්වා නැත. |

## 3.7 පාඩු හා හානි

---------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| WPPG – 9796 යන වාහනයට සිදුවූ හානි පිළිබඳව අලාභය මෙතෙක් ඇස්තමේන්තු කර නොමැති අතර WPKH – 4645 යන වාහනය මාස 04 ක කාලයක් ඉක්මවා ඇතත් තවමත් අලුත්වැඩියා කටයුතු නිමකර නොතිබුණි. | අලාභයන් තක්සේරු කර අලුත්වැඩියා සිදු කිරිමෙන් පසු ධාවනයට සුදුසු තත්ත්වයට පත් කළ යුතු වීම හෝ එසේ කළ නොහැකි නම් අපහරණය කිරීම | WPKH-4645 රථයේ අලාභය රු 1,500,000 ට අවසාන වශයෙන් තක්සේරුකර අළුත්වැඩියාව සිදුකරමින් පවතී. අළුත් වැඩියාව නොපමාව සිදු කර අමාත්‍යාංශය වෙත ආපසු ලබා දෙන බව අදාළ ආයතනය විසින් දැනුවත් කර ඇත. අංක WPPG-9796 රථයේ අලාභයන් නැවත තක්සේරු කිරීම සිදුකරමින් පවතින බැවින් නොපමාව රථයේ අලාභයන් තක්සේරුකර අළුත්වැඩියාවන් නිම කිරීමට කටයුතු කරමින් පවතී. |

## 3.8 කළමනාකරණ දුර්වලතා

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | විද්‍යා සම්පත් මධ්‍යස්ථානවලට අනුයුක්ත නිලධාරීන් පත් කිරීම්, උසස් කිරීම්, වැටුප් හා සේවා කොන්දේසි වැනි ගැටළු තීරණය කිරීම උදෙසා සේවා ව්‍යවස්ථාවක් අනුමත කර දීමට කටයුතු නොකිරීම හේතුවෙන් විද්‍යා තාක්ෂණ නිලධාරීන් අමාත්‍යාංශය වෙත අප්‍රසාදය පල කරන අතර, එය ඔවුන්ගේ කාර්ය සාධනය | සේවා ව්‍යවස්ථාවක් අනුමත කරදීමට කටයුතු කළ යුතු වීම | විද්‍යා හා තාක්ෂණ නිලධාරින්ගේ ශ්‍රේණි උසස්වීම් පටිපාටිය සඳහා වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ, හා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ නිර්දේශ ලැබී ඇති අතර අදාල සංශෝධන සමඟ රජා සේවා කොමිෂන් සභාවේ අනුමැතියට ඉදිරිපත් කිරීමට කටයුතු කෙරෙමින් |

| | | | |
|---|---|---|---|
| | කෙරෙහි සෘජු බලපෑමක් සිදුකර ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය. | | පවතී. |
| (ආ) | විද්‍යාතා මධ්‍යස්ථාන නිලධාරීන් වෙත 2018 වර්ෂයේ දී පවත්වා තිබූ පුහුණු වැඩසටහන් අතරින් තාක්ෂණික පැවරුම් පිලිබඳ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක නොකිරීම තුලින් අපේක්ෂිත කාර්ය සාධනය ළඟා කර ගැනීමට නොහැකි වී තිබුණි. | විද්‍යාතා මධ්‍යස්ථාන නිලධාරීන් වෙත තාක්ෂණික පුහුණු අවස්ථා සලසා දිය යුතු වීම | පිළිතුරු ලබාදී නැත |
| (ඇ) | විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය විසින් සෙත්සිරිපාය I අදියර ගොඩනැගිල්ලේ 3 වන මහලේ වර්ග අඩි 2800 ක කොටසක් 2018 ජුනි 29 දින සිට 2018 ඔක්තෝම්බර් 26 දක්වා කාල පරිච්ඡේදයකට තරුණ කටයුතු ව්‍යාපෘති කලමණාකරණ සහ දක්ෂිණ සංවර්ධන රාජ්‍ය අමාත්‍ය කාර්යාලය වෙත ලබා දී තිබුණි. අදාල කුලිය ලෙස රු. 1,729,826 ක් විද්‍යා,තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය විසින් නාගරික සංවර්ධන අධිකාරිය වෙත ගෙවා තිබුණි. මේ දක්වා මෙම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කුලී මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම | තරුණ කටයුතු ව්‍යාපෘති කළමනාකරණ සහ දක්ෂිණ සංවර්ධන රාජ්‍ය අමාත්‍ය කාර්යාලය ඉහත කාර්යාල පරිශ්‍රයේ පවත්වාගෙන යනු ලැබූ 2018.06.29 දින සිට 2018.10.26 දක්වා කාල පරිච්ඡේදයට අදාළ ගොඩනැගිලි කුලිය මෙම අමාත්‍යාංශය මඟින් නාගරික සංවර්ධන අධිකාරිය වෙත ගෙවා ඇත. එබැවින් එම කාර්යාල පරිශ්‍රය වෙනුවෙන් වර්ග අඩියකට රු 158.409 බැගින් වර්ග අඩි 2800ක් සඳහා රු 1,729,826.28 මුදලක් මෙම අමාත්‍යාංශය වෙත ප්‍රතිපූරණය කිරීමට අවශ්‍ය කටයුතු යොදන මෙන් එම අමාත්‍යාංශයෙන් ඉල්ලා ඇත. එසේ නමුත් වරාය හා නාවික කටයුතු සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක PSSD/01/Building Rent හා 2019.01 දින රහිත ලිපිය මඟින් දන්වා ඇත්තේ 2009 වර්ෂය සඳහා යෝජිත අයවැය ලේඛනය තුලින් ප්‍රතිපාදන වෙන් කරනු ලබන්නේ 2018.12.21 දිනෙන් පසු ඇති කරනු ලැබූ වරාය හා |

| | | | |
|---|---|---|---|
| | | | නාවික කටයුතු සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය සඳහා පමණක් බැවින් එම අමාත්‍යාංශයට පෙර පැවති අමාත්‍යාංශයට අදාල වියදම් ප්‍රතිපූර්ණය කිරීමේ හැකියාවක් නොමැති බවයි. එම මුදල් මෙම අමාත්‍යාංශය වෙත ප්‍රතිපූරණය කිරීමට කටයුතු කරන ලෙස නැවත එම අමාත්‍යාංශය වෙත සිහි කැඳවීමක් යවා ඇත. |
| (ඇ) | කියුබා නිල සංචාරය හා දකුණු අප්‍රිකානු නිල සංචාරයන් සඳහා කාර්මික තාක්ෂණ ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාද සහභාගි වී ඇති අතර ඔහු වෙනුවෙන් ගුවන් ගමන් වියදම් හා ගුවන් ගමන් දින වෙනස් වීම වෙනුවෙන් ගෙවන ලද පිළිවෙලින් රු. 379,000 හා රු. 12,500 ක මුදලක් අමාත්‍යාංශයට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ සඳහා අමාත්‍යාංශය වැය කළ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම | අදහස් දක්වා නැත. |
| (ඉ) | ග්‍රහලෝකාගාරයේ විදුලි බිල්පත් ප්‍රමාද වී ගෙවීම හේතුවෙන් 2018 වර්ෂය තුල පමණක් රු. 30,328 ක මුදලක් පොලී මුදල් වශයෙන් ගෙවා තිබූ අතර මෙම තත්වය දිගින් දිගටම පැවතියද එය නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ආයතනයේ කළමණාකරණ මණ්ඩලය කාල ප්‍රමාදයෙන් තොරව කටයුතු කළ යුතු වීම | - එම - |
| (ඊ) | න්‍යෂ්ටික පර්යේෂණ සහයෝගිතා පිළිබඳ යුරෝපා සංගමයේ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (PHD) හැදෑරීම සඳහා සිසුන් තෝරාගෙන තිබුණි. තෝරාගත් සිසුවියක් ස්විස්ටර්ලන්තයේ ජිනීවා නගරයට යාමට නියමිත දිනය වෙනස් වීම නිසා ලංකා බැංකු සංචාරකයින් (BOC | අමාත්‍යාංශයේ මුදල් ඵලදායීව යෙදවිය යුතු වීම. | - එම - |

Travels) වෙත රු. 81,100 ක දින වෙනස් වීමේ ගාස්තුවක් ගෙවා තිබුණු අතර මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශය ගනු ලබන පියවර විගණනය වෙත ඉදිරිපත් නොවීය.

**4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධන ඉලක්ක ලඟා කර ගැනීමට සූදානම් වීමේදී අනෙකුත් ආයතන සමඟ මනා සම්බන්ධීකරණයක් නොමැති වීම හේතුවෙන් ඉලක්කගත අරමුණු කරා ලඟා වීමට සැලසුම් සකස් කිරීමේදී හා පෙර සූදානම් වීමේ ක්‍රියාවලිය ඉතා දුර්වල මට්ටමක පැවති බව නිරීක්ෂණය විය. | ඉලක්ක ගත අරමුණු කරා ලඟාවීමට සැපසුම් සකස් කළ යුතු වීම | තිරසර සංවර්ධන අරමුණු පදනම් කොට ගනිමින් අමාත්‍යාංශයේ සියලු වැඩසටහන් සකස් කර ඇත. නමුත් ඒවා ක්‍රියාත්මක කිරීමේදී ඉලක්කගත අරමුණු ඉටුකරගෙන ඇති ද යන්න ඇඟයීමට නිශ්චිත දත්ත පද්ධතියක් නොමැති බව සත්‍යයකි. එය නිසිපරිදි සැකසීම සඳහා මේ වන විට කටයුතු කරමින් පවතී. |

**5. මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය අවසාන වනවිට මුළු පුරප්පාඩු 126 පිරවීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි. අතිරික්ත තනතුරු පවතී නම් භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර එම තනතුරු යටපත් කිරීමටද අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. | අනුමත තනතුරුවලට නිලධාරින් බඳවා ගැනීමට කටයුතු කළ යුතු වීම හෝ අතිරික්ත තනතුරු වේ නම් ඒවා යටපත් කිරීමට කටයුතු කළ යුතු වීම. | ඉදිරියේදී එම පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් කරනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ දිස්ත්‍රික් විද්‍යා හා තාක්ෂණ නිලධාරීන් 25 ක් හා ක්ෂේත්‍ර සම්බන්ධීකාරක නිලධාරීන් 13 ක් පුරප්පාඩු වී ඇති නිසා එය ආයතනයේ විද්‍යාත්මක සම්පත් මධ්‍යස්ථානවල කාර්යක්ෂමතාව පහල මට්ටමක පැවතීමට සෘජු ලෙස බලපා තිබූ බව නිරීක්ෂණය විය. | - එම - | දිස්ත්‍රික් විද්‍යාත්මක නිලධාරි තනතුරු 25 සඳහා වන බඳවා ගැනීමේ පරිපාටියට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය හිමි වී ඇති අතර ඒ සඳහා බඳවා ගැනීමේ නිවේදනය (ක්‍රමය) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් සිදුකිරීම යන සංශෝධනයට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලැබී නැත. කෙසේ වෙතත් මෙවරට පමණක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් බඳවා ගැනීමට අනුමැතිය ලැබී ඇත.ඒ අනුව එම අනුමැතිය ලබා දුන් දින සිට බලපැවැත්වෙන පරිදි බඳවා ගැනීම සිදුකිරීමට කටයුතු කිරීමට අභ්‍යන්තර අයදුම්පත් කැඳවීමටත්, නම්කරන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සඳහා අනුමැතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙතත් ඉදිරිපත් කර ඇත. |